# අක්ඛණ සූත්‍රය

(අං.නි. v, 128-134 පිටු)

## නොකල් අටෙකි පින්කම් කළ නොහැකි

*(කුසල් වැඩුමට අයෝග්‍ය අවස්ථා)*

### පැසදිනාහි ලොස් ඇන්ජලිස් බෞද්ධ විහාරය

## ධර්ම චාරිකා වැඩසටහන

(2560/2017. 02. 04 සෙනසුරාදා)

# අක්ඛණ සූත්‍රය

සසර අතිදීර්ඝ කාලයක් බුද්ධත්වය උදෙසා අප බෝසතාණන් වහන්සේ පාරමී ධර්ම සම්පූර්ණ කළේ ලෝක සත්ත්වයා කෙරෙහි අතිශය කරුණාවෙනි. සසර ස්වභාවය පිළිබඳ අනවබෝධය නිසා ලෝභයෙන් ඇලී ද්වේෂයෙන් දැවී මෝහයෙන් මුළා වී කටයුතු කරන සත්ත්වයන් සසරෙහි අත්විඳින අනන්ත දුක් උන්වහන්සේ ප්‍රත්‍යක්ෂයෙන් ම අවබෝධ කළහ. එබැවින් සත්ත්වයන් ඉන් මුදවාලීමේ බලවත් කරුණාවක් ඇති විය. එහි ප්‍රතිඵල වශයෙන් සාරාසංඛ්‍යය කල්ප ලක්ෂයක් පුරා දානාදී බුද්ධකාරක ධර්ම සම්පූර්ණ කොට සම්බුද්ධත්වයට පත් වූයේ ලෝසතුන්ට පිහිට වීමේ උදාර අපේක්ෂාව ඇතිවයි. සම්බුද්ධත්වයෙන් පසුව පුරා වසර 45 ක් දිවා රෑ නොබලා ඉමහත් වෙහෙසක් දරමින් නුවණැති සත්ත්වයන්ට සසර ස්වභාවයත් සසරින් මිදීමේ මාවතත් දේශනා කළහ.

මෙලොව ජීවත් වන මිනිසුන් මෙන් ම අනෙකුත් සත්ත්වයන්ට විවිධ ආකාර දුක් කරදරවලට මුහුණපෑමට සිදු වේ. ඒ අතර මහලුවීම, ලෙඩවීම, මරණය, අප්‍රියයන් හා එක්වීම, ප්‍රියයන්ගෙන් වෙන්වීම, කැමැති දෑ නොලැබීම ආදිය ප්‍රධාන ය. මෙහිලා බුදුරජාණන් වහන්සේ සසරගත සත්ත්වයන්ට මුහුණපෑමට සිදුවන ප්‍රධාන දුක ලෙස දක්වා ඇත්තේ රූපාදී ස්කන්ධ පංචකය පිළිබඳ ව පවත්නා දුකයි. එහි ප්‍රතිඵල වශයෙන් සසර බොහෝ කල් අපාගත වීමට සිදුවන අවස්ථා එමට ය. මෙලොව උපන් සත්ත්වයකුට මරණින් මතු අපාගත වීමට සිදුවීම බලවත් අවාසනාවකි. විශේෂයෙන් බුදුවරයකුගේ දහමක් ශ්‍රවණය කිරීමට අවකාශ ලද, දුර්ලභ මිනිස් භවයක් ලද මෙවන් සමයක ජීවත් වන්නෙකු මරණින් මතු අපාගතවීමට වීම තරම් බරපතල අවාසනාවක් තවත් නැත. එබැවින් නුවණැති සත්පුරුෂ සැමගේ ජීවිතයේ ප්‍රධාන ඉලක්කය විය යුත්තේ මරණින් මතු අපාගත නොවන ලෙස තම කායාදී ද්වාරත්‍රය හසුරුවා ගැනීමයි. ඒ අතර නිර්වාණාවබෝධය සඳහා අවශ්‍ය පිළිවෙත් සපුරා ගැනීමයි.

අංගුත්තර නිකායෙහි අට්ඨක නිපාතයෙහි ඇතුළත් **අක්ඛණ** සූත්‍රයෙහි නිවන් මගෙහි පිළිවෙත් පිරීමට අයෝග්‍ය අවස්ථා අටක් විස්තර කර තිබේ. ඒ පිළිබඳ ව වීදාගම මෛත්‍රෙය මාහිමියන් විසින් රචිත ලෝවැඩ සඟරා නම් ග්‍රන්ථයෙහි ද මෙලෙස සඳහන් ව ඇත.

සියල් සසර දුක් දුරුකරූ නොයෙකී
අසල් කරන මොක් සිරිසැප නිසැකී
සියල් සතුනි පින් කරවයි මුනි කී
නොකල් අටකි පින්කම් කළ නොහැකී

ඛණ හෙවත් ක්ෂණය යනු යෝග්‍ය අවස්ථාවයි. එනම් යමක් කිරීමට සුදුසු/ උචිත මොහොතයි. අක්ඛණ හෙවත් අක්ෂණය යනු එලෙස සුදුසු /යෝග්‍ය නැති මොහොතයි. සම්බුදු සසුනක බඹසර විසීමට අවකාශ නොමැති අවස්ථා අටක් පිළිබඳ ව සූත්‍රයෙහි දැක්වේ. එම අට නම් :

1. නිරයෙහි ඉපදීම
2. තිරිසන් යෝනියෙහි ඉපදීම
3. ප්‍රේතලෝකයෙහි ඉපදීම
4. අසඤ්ඤසත්ත වැනි දීර්ඝායුෂ දේවනිකායෙක ඉපදීම
5. බුදුබණ ඇසීමට අවකාශ නොලැබෙන ප්‍රත්‍යන්ත ජනපදයක ඉපදීම
6. දැඩි මිථ්‍යාදෘෂ්ටිවල එල්බ බුදුබණ නොඅසන පවුල්වල ඉපදීම
7. මිනිස් ලොව මූඪ ව කෙළ තොලු ව දුෂ්ප්‍රාඥ ව ඉපදීම
8. මිනිස් ලොව බුද්ධිමත් ව මනා උපතක් ලද කල්හි බුදුවරයකු පහළ ව නොසිටීම

මෙම අවස්ථා අට නොකල් හෙවත් අක්ඛණ එනම් : කුසල් වැඩීමට නුසුදුසු අවස්ථා හෙවත් අභව්‍ය ස්ථාන ලෙස ධර්මයෙහි විස්තර වේ. තමන් වහන්සේ ලද සර්වඥතා ඥානයෙන් ලෝකය පිළිබඳවත් සත්ත්වයා පිළිබඳවත් ඉතා පුළුල් වූත් නිවැරදි වූත් අවබෝධයක් සහිත ව සිටි බුදුරජාණන් වහන්සේ මේ තත්ත්වය මැනැවින් දැන ලොවට දේශනා කළහ. ලොව කිසිදු පුද්ගලයකුට නොදෙවෙනි වූ මෙම අවබෝධය ධර්මශ්‍රවණය තුළින් ශ්‍රාවකයාට ද ලබා ගැනීමේ භාග්‍යය උදාවී තිබේ. බුදුබණ නොමැති සමයක මේ තත්ත්වය දැනගැනීමට හෝ අවකාශයක් නොමැත. සත්ත්වයන් දුක්විඳින මෙබඳු අවස්ථා පිළිබඳ අසා දැනගැනීමටත් එම අනතුරින් මිදීමටත් හැකියාව ලැබෙන්නේ බුද්ධෝත්පාද සමයක උපත ලද නුවණැති භාග්‍යසම්පන්නයන්ට පමණි. යමෙකුට තම සාමාන්‍ය බුද්ධි මට්ටමින් මේ පිළිබඳ ව සම්පූර්ණයෙන් දත නොහැක. බුදුරජාණන්

වහන්සේගේ සර්වඥතාඥානය පිළිබඳ ශ්‍රද්ධාව පිහිටුවා ගැනීමෙන් යම් පමණකට මේ පිළිබඳ අවබෝධයක් ලද හැකි අතර ධර්මමාර්ගයේ ඉදිරියට ගමන් කිරීමේදී ධ්‍යාන, අභිඥා ලැබීම් වශයෙන් තවදුරටත් මේ තත්ත්වය වටහා ගැනීමට හැකියාව ලැබේ. ඉහත දැක්වූ අවස්ථා අට පිළිබඳ ව කෙටියෙන් විමසා බලමු.

## 1. නිරයෙහි ඉපදීම :-

අපාය ප්‍රධාන වශයෙන් කොටස් හතරකි. එනම් නිරය, තිරිසන්, ප්‍රේත, අසුර යන සතර අපායයි. සත්ත්වයන් උපදින ස්ථාන අතර සැපයෙන් පහ වූ වඩාත්ම දුක් විඳින අවස්ථාව ලෙස සැලකෙන්නේ සතර අපාය අතුරින් නිරයයි. නිරය ප්‍රධාන වශයෙන් කොටස් අටකටත් විස්තරාත්මක ව 136කටත් බෙදා දක්වා තිබේ. එනම් සඤ්ජීවය, කාළසූත්‍රය, සංඝාතය, රෞරවය, මහාරෞරවය, තාපය, ප්‍රතාපය, අවීචිය වශයෙනි. මේ අතරින් **සඤ්ජීව** යනු යමපල්ලන් විසින් කඩ කඩ කොට සිඳිනු ලබද්දීත් නැවත නැවතත් උපදිමින් දුක් විඳින නිරයයි. යමපල්ලන් විසින් ගිනිගත් කළු උල් ගසා ගිනිගත් වෑයෙන් සතරැස් අටැස් සොළොසැස් කොට සස්නා නරකය **කාළසූත්‍ර** නිරයයි. යකඩින් සැදි පර්වතයෙන් සතුන් සුන් සුන් කොට මිරිකන නරකය **සංඝාත** නම් වේ. නවද්වාරයෙන් ඇතුළු ව සියලු ශරීරය තවන ක්ෂාර ධූමයෙන් මහත් සේ පැසෙන් සතුන් ඇති නරකය **රෞරවයයි. මහාරෞරවය** යනු රතු පැහැති ලෙයින් ගිනිදැලින් පිරුණු බලවත් දුකින් ගුගුරා පැසෙන සතුන් ඇති නරකයයි. ගිනිගත් යකඩ පොළොවෙහි ගිනිගත් යවුල්වල හිඳුවන ලද සත්ත්වයන් නිශ්චල ව පැසෙන්නාවූ නරකය **තාප** නම් වේ. එය තවදුරටත් දරුණු ලෙස සිදුවන අවස්ථාව **ප්‍රතාපයයි.** ගිනිදැල්වලින් ද සත්ත්වයන් විසින් ද දුක්වලින් ද අතරක් නැතිව පැසෙන නරකය **අවීචියයි.** මෙම අටමහා නරකයෙහි ම එක් එක් නිරයක් පාසා මහා දොර සතර බැගින් වෙයි. ඒ එක් එක් දොරෙහි සතර බැගින් වූ උත්සදනරක ය. ඒ අනුව එක් එක් මහානරකයෙහි දහසය බැගින් උත්සද නිරයන් වන අතර සියල්ල එක් කළ විට උත්සද නිරය 128 කි. මහානිරය අට ද ඊට එක් වූ විට සමස්ත නිරය සංඛ්‍යාව 136 ලෙස දැක්වේ.

පංචානන්තරිය පාපකර්ම, නියත මිථ්‍යාදෘෂ්ටිය, ධර්මය වරදවා ගැනීම් ආදී අකුසලයන්ගේ විපාක වශයෙන් උපදින නිරයන්හි සත්ත්වයන් විඳින දුක් අපමණ ය. එලෙස දුක් විඳින කාලය ද ඇතැම් විට බුද්ධාන්තර කල්ප ගණන් වන්නේ ය. සාමඤ්ඤඵල, බාලපණ්ඩිත, දේවදූත ආදී සූත්‍රයන්හි මේ පිළිබඳ තොරතුරු ඇතුළත් වේ. සද්ධම්මොපායනහි දැක්වෙන පරිදි,

***'කාරෙන්තො කම්මකරණං - නිරයෙ අතිදාරුණං,***
***භයානකං භුසං ඝොරං - කථං පුඤ්ඤං කරිස්සති'.***

නිරයෙහි ඉතා තියුණු වූ බිය උපදවන කර්කශ දුක් නිතර විඳින කල්හි කෙසේ නම් පුණ්‍ය කර්ම කරන්න ද?

නිරය පිළිබඳ වත් ඒවායෙහි දී අත්විඳින අනේක දුක් පිළිබඳවත් ධර්මප්‍රදීපිකාව, නිමිජාතක, සංකිච්ච ජාතක ආදියෙහි සඳහන් වේ. ලෝවැඩ සඟරාවෙහි එය මෙසේ දක්වා ඇත.

සිතුවත් බිය කරවන අරතරයේ
වැටුනොත් එක්සිය සතිසක් නිරයේ
බලවත් දුක් විඳිනෙය කරදරයේ
මඳකුත් පිනකට නැත අවසරයේ

## 2. තිරිසන් යෝනියෙහි ඉපදීම :-

කුසල් වැඩීමට අයෝග්‍ය ස්ථාන අතර දෙවැන්න තිරිසන් භවයයි. මෙය අපට පෙනෙන භවයකි. අපා, දෙපා, සිව්පා, බහුපා වශයෙන් උපදින පියාඹින, පිහිනන, ඇවිදින, බඩගා යන, ජලයෙහි, පොළොව මතුපිට, පොළොව ඇතුළත ආදී වශයෙන් වෙසෙන තිරිසන්නු විවිධාකාරවත් ව සිටිති. අණ්ඩජ, ජලාබුජ, සංසේදජ, ඕපපාතික යන ආකාර සතරින් තිරිසන්නු උපදිති. අණ්ඩජ යනු බිත්තරවලින් උපදින පක්ෂීන්, සර්පයන් වැනි සතුන් ය. ජලාබුජ යනු මව්කුසින් උපදින ගව, එළු, බලු ආදී සතුන් ය. සංසේදජ යනු තෙත් ගති ඇති, පල්වූ ජලය ඇති තැන්වල උපදින සතුන් ය. ඕපපාතික යනු ඉහත ආකාර තුනින් තොර ව ඉබේම ඉන්ද්‍රිය පහළ වීම් වශයෙන් උපදින සතුන් ය. නිරයෙහි තරම් දැඩි දුක් තිරිසන් සත්තු නොවිඳිති. එහෙත් තිරිසන් ව ජීවත් වන සමයෙහි ජීවිතය පවත්වා ගැනීමේදී යළි යළිත් අකුසල් ම සිදු කරන නිසාත් කුසල් කිරීමට අවකාශ මඳ

නිසාත් තිරිසන් ව උපන් සතෙකු ඉන් ගැලවීම අතිශය දීර්ඝකාලයින් සිදු වන්නකි. දුසිල්බව නිසා තිරිසන් ව උපන්න ද දානයෙහි ආනිසංස වශයෙන් සැපවිඳින ඇතැන් තිරිසනුන් සිටිය ද දහමින් ප්‍රයෝජන ගැනීමට තරම් ශක්තියක් ඔවුන්ට නොමැත. දළදා මාලිගාවේ ඇතා වැනි ඇතැම් තිරිසනුන් යම් යම් පුණ්‍යකර්මයන්ට සහභාගී වුව ද බුදුවරයකුගේ දහමින් ලද හැකි උත්කෘෂ්ට ඵල ලැබීමට තිරිසනුන්ට අවකාශ නොමැත.

'**මනුස්සානං පච්චක්ඛං තිරච්ඡාදුක්ඛං ...**' යනුවෙන් ලංකාරවර්ණනාවෙහි දැක්වෙන පරිදි මිනිසුන් අතර නිතර ගැවසෙන සත්ත්ව කොට්ඨාසයක් හෙයින් තිරිසන් භවය පිළිබඳවත් තිරිසන්දුක පිළිබඳවත් ප්‍රත්‍යක්ෂ අවබෝධයක් මිනිසුන්ට පවතී. සද්ධම්මොපායනයෙහි දැක්වෙන්නේ 'යම් සත්ව කෙනෙක් සරසට (හරස් අතට) සිතත් ද සරසට යෙත් ද සරසම නිදියත් ද එහෙයින් තිරිසන් = තිරච්ඡාන නමින් හැඳින්වෙන බවයි.

***'තිරියතො එව චින්තෙන්ති ගච්ඡන්ති ච සයන්ති ච,***
***තිරොගතිච්ඡා ධම්මෙසු තිරච්ඡානා තතො මතා'.***

ලෝවැඩ සඟරාවෙහි තිරිසන් සතුන් පිළිබඳ ව මෙලෙස සඳහන් වේ.

තිරිසන් ජාතියෙ උපනත් පව් කොට
අවසන් නොව බිය පවතියි පිට පිට
මඳසන් සුන් කමකුත් නැත හැම විට
සලසන්නේ කෙලෙස ද සිත පිනකට

තිරිසන් සතුන් වෙත කාම, ගෝචර, මරණ යන සංඥා තුන නිතර පවතී. එනම් නිතර කම්සැප සෙවීමට ඇති කැමැත්ත, ආහාර සෙවීමට නිතර නියුතුවීම හා මරණය පිළිබඳ ව නිතර පවත්නා බිය යන කරුණු තුනයි. මෙබඳු තත්ත්වයක් මත කුසලයක් වෙත නැඹුරු වීමට අවකාශයක් හෝ ඊට සරිලන මානසික දියුණුවක් හෝ තිරිසනුන් තුළ නොමැත.

### 3. ප්‍රේතලෝකයෙහි ඉපදීම :-

ප්‍රේත යනු සත්ත්වයන් උපදින තවත් අපායකි. ලෝ වැසියන් විසින් ඉතා පිළිකුළින් බැහැර කරනු ලබන සෙම්, සොටු, අසුචි, වැදෑ මස් ආදිය ආහාර වශයෙන් ගනිමින් දැඩි සා පිපාසා හේතුවෙන් ආහාරපාන පිළිබඳ ඉතා ගිජු ව වෙසෙන සත්ත්ව කොට්ඨාසයක් මෙයින් කියැවේ. බොහෝ විට මිනිස් ඇසට නොපෙනෙන මෙම ප්‍රේතයන් ඇතැම් ධ්‍යානලාභි අයට දර්ශනය වේ. ඒ අතර බල්ලන් වැනි ඇතැම් තිරිසන් සතුන්ට ද ඇතැම් කැමරා කාචයන්ට ද ලක් වේ. කලාතුරකින් ඇතැම් ප්‍රේතයන් මිනිසුන්ට මුණ ගැසුණු අවස්ථා පිළිබඳ ව සඳහන් වේ. සැරියුත් මාහිමියන් දිනක් පිණ්ඩපාතයේ වඩින අවස්ථාවක පෙරභවයක මවක් ප්‍රේත ව ඉපිද සිටින අයුරු දැක තිබේ.

ප්‍රේතයන් නිජ්ඣාමතණ්හික, ඛුප්පිපාසික, පරදත්තූපජීවී, පංසුපිසාච යනුවෙන් කොටස් හතරකි. **නිජ්ඣාමතණ්හික** යනු සිරුරෙහි දැල්වුණු ගිනිදැලින් දැවෙන සිරුරු ඇති ප්‍රේතයන් ය. **ඛුප්පිපාසි** යනු සා පිපාසා දෙකින් පෙළෙන ප්‍රේතයන් ය. **පරදත්තූපජීවී** යනු අන් අය දෙන දෙයින් ජීවත් වන ප්‍රේතයන් ය. **පංසුපිසාච** යනු කසල ගොඩ ආදී අපිරිසුදු තැන්හි වෙසෙන ප්‍රේතයන් ය. ඒ අතර **කාලකඤ්ජික** නම් ප්‍රේත කොට්ඨාසයක් ද සිටින අතර ඔවුන් අයත් වන්නේ ආසුර ගණයටයි. ඔවුන්ගේ ශරීර ඇතැම්විට ගව්ගනන් විශාල බව සඳහන් වේ. එසේ වුව ද කරන ලද දැඩි අකුසලයන්හි විපාක විඳීම් වශයෙන් මුඛය ඉඳිකටු මල තරම් ඉතා කුඩාවට පිහිටා තිබේ. පේතවත්‍ථු නම් ඛුද්දක නිකාය ග්‍රන්ථයෙහි ද පාරාජිකා පාලියෙහි ද සංයුත්ත නිකායෙහි ලක්ඛණ සංයුත්තයෙහි ද ප්‍රේතයන් පිළිබඳ තොරතුරු දැක්වේ.

සද්ධම්මොපායනයෙහි දැක්වෙන පරිදි තම ශක්ති පමණින් අන් අයට බෙදා නොදෙන, ඊර්ෂ්‍යා බහුල, තම සම්පත් සඟවන (මසුරු) අය ප්‍රේත ලෝකයෙහි උපදින බව සඳහන් වේ.

***'අසංවිභාගසීලා යෙ යථාසත්ති යථාබලං,***
***ඉස්සාලුකා මච්ඡරිනො තෙ පෙතෙසූප ජායරෙ'.***

ප්‍රේතයන්ට ඇති බලවත් ම ව්‍යසනය නම් සා පිපාස දෙකයි. ඇතැම් විට මහාගංගා, මහාවිල් අසබඩ ඉපිද සිටිය ද අකුසල කර්මයන්හි බලවත්කම නිසා උගුරු තෙමෙන තරම් පමණ වූ ද දියපොදක් නොලැබෙන බව දක්වේ. වතුර අතට ගත් සැණින් ඒවා වියැළී යයි. එබැවින් ප්‍රේතලෝකවල ඉපිද අග්නි ශෝක සන්තාපයන්ගෙන් වියැළී සා පිපාසාවෙන් පීඩිත වූයේ කෙසේ නම් පින් කරන්නේ දැයි සද්ධම්මොපායනයෙහි සඳහන් ය.

*'ගන්ත්වාන පෙත්ති විසයං සන්තාප පරිසොසිතො,*
*ඛුප්පිපාසා පරිස්සන්තො කථං පුඤ්ඤං කරිස්සති'.*

ලෝවැඩ සඟරාවෙහි ප්‍රේතයන්ගේ ස්වභාවය මෙසේ සරල ව දක්වා ඇත.

උපනත් පේත ව පව් කොට නොපණත්
කලෙකත් නොලැබෙයි සෙම්සොටු පමණත්
උගුරත් නොතෙමෙයි සුරගඟ වැටුණත්
කලෙකත් පින් නොකළැකිමයි සිතුනත්

## 4. අසඤ්ඤසත්ත වැනි දීර්ඝායුෂ දේවනිකායෙක ඉපදීම :-

බුදුවරුන් ලොව පහළ ව ධර්මදේශනා කරන ඇතැම් කාලයන්හි අසඤ්ඤසත්ත වැනි ඇතැම් රූපාවචර බ්‍රහ්මලෝකයෙහි ද අරූපාවචර බ්‍රහ්මලෝකයන්හි ද මහාකල්ප සියගණන් දීර්ඝායුෂ්ක ව ඉපිද ධර්මයෙන් ඵලයක් ගත නොහැකි ව සිටිති. ධ්‍යාන වඩා සිත භාවිත කොට සුගතිගාමී ව උපත ලැබුව ද ධර්මයෙන් ඵල නොලද හැකි බැවින් එබඳු භවයන් අභව්‍ය ස්ථාන ලෙස සැලකේ. ඇතැම් අවස්ථාවන්හි සම්මා සම්බුදුරජාණන් වහන්සේලා සිය ගණන් පහළ වුව ද ඒ පිළිබඳ ආරංචි මාත්‍රයක් පවා නොඅසා ම අතිදීර්ඝ කාලවකවානු දිවි ගෙවති.

අසඤ්ඤසත්ත යනු කය පමණක් ඇති සිත නැති බඹලොවකි. ආකාසානඤ්ඤායතන, විඤ්ඤාණඤ්චායතන, අකිඤ්චඤ්ඤායතන, නේවසඤ්ඤානාසඤ්ඤායතන යන බඹලොව සතර සිත පමණක් ඇති කය නැති බ්‍රහ්මලෝකයයි. මෙම භවයන්හි ධර්මශ්‍රවණයට හෝ ඊට අනුගත පිළිවෙතට පැමිණීමට හෝ අවකාශ නොමැත. ආලාරකාලාම, උද්දක රාමපුත්ත වැන්නවුන්ට ධර්ම අනුග්‍රහයක් ලබාදීමට බුදුරදුන් නොහැකි වූයේ මේ නිසයි.

ලෝවැඩ සඟරාවෙහි එය මෙසේ සනිටුවහන් වේ.

සිත මිස කය නැති බඹලොව සතරකි
සිත නැති ව ම කය ඇති බඹ තලයකි
මෙද සත පින් කොට උපදින පෙදෙසකි
එහි උපනත් කුසලක් නොම කළ හැකි

## 5. බුදුබණ ඇසීමට අවකාශ නොලැබෙන ප්‍රත්‍යන්ත ජනපදයක ඉපදීම :-

බුදුරජාණන් වහන්සේ ලොව පහළ ව ධර්මදේශනා කරන ඇතැම් සමයන්හි ඇතැමෙක් පුණ්‍ය විපාක ලෙස මිනිස් ලොව ඉපදුන ද සිව්වනක් පිරිස නොමැති ඇත දුර බැහැර ම්ලේච්ඡ ජනයා වෙසෙන ප්‍රත්‍යන්ත දේශයන්හි උපදිති. ඔවුන්ට ද සද්ධර්මයෙන් හෝ බුද්ධෝත්පාදයෙන් හෝ මිනිසත් භවයෙන් හෝ නිසි ප්‍රතිඵල ලැබීමට අවකාශ නොලැබේ.

සද්ධම්මෝපායනයට අනුව තෙරුවන් සරණ ගිය ශ්‍රාවකයන් නොමැති අතිශයින් අධර්මය බහුල ප්‍රත්‍යන්ත දේශයන්හි වූවන්ට කෙසේ නම් පින් කර ගැනීමක් වන්නේ දැයි ? සඳහන් වේ.

*'අච්චන්තාධම්මබහුලෙ මුනින්දසුතවජ්ජිතෙ,*
*පච්චන්තවිසයෙ ජාතෙ කථං පුඤ්ඤං කරිස්සති'.*

ලෝවැඩ සඟරාවෙහි එය මෙසේ දැක්වේ.

පව්මිස පිනකැයි නොකරන හැම කල
මුනි බණ නොපැවැති පසල් දනව්වල
නිසි ලෙස උපනත් ලැබ දන මන කල
කිසි කලෙකත් කුසලක් නොකළැකි බල

## 6. දැඩි මිථ්‍යාදෘෂ්ටිවල එල්බ බුදුබණ නොඅසන පවුල්වල ඉපදීම :-

බුද්ධෝත්පාද සමයක ඇතැමෙක් බුදුරදුන් දැකීමට තරම් සුදුසු පෙදෙසක වාසය කළ ද දැඩි මිථ්‍යාදෘෂ්ටික මතවාද සහිත පවුල්වල ඉපිද ධර්මයෙන් ඵලයක් නොලබා ම මියයති. නත්‍ථි දින්නං, නත්‍ථි යිට්ඨං ... ආදී වශයෙන් දැක්වෙන නියති මිථ්‍යාදෘෂ්ටි ගත්තවුන් මීට අයත් වේ. එවැනි මත දැඩි ව ගත්තවුන් සම්බුදුවරයකුගේ දහමක් නමුදු බැහැර කරති. ධර්මශ්‍රවණය නොකරන තැනැත්තාට ඉන් ප්‍රතිඵල ගැනීමට අවකාශ නොලැබේ. බුදුරදුන් සමයෙහි විසූ චුන්දසූකර වැන්නවුන් මීට නිදසුන් වශයෙන් දැක්විය හැකි ය. මෙකල වුව ද ආගමික නාමයෙන් විවිධ මිථ්‍යාමතයන්හි එල්ඹ සිටින අන්‍යාගමික බොහෝ දෙනාට සද්ධර්මයෙන් ප්‍රතිඵල ලබා ගැනීමේ අවකාශ අහිමි ව තිබේ. මෙය බලවත් අභාග්‍යයකි. එසේ වුව ද ඇතැම් නුවණැති විද්වතුන් ආගම් භේදය පසෙක දා බුදුදහමේ ඇතුළත් සිද්ධාන්ත අධ්‍යයනය කරන්නටත් ඒවා අනුගමනය කරන්නටත් දරන ප්‍රයත්නය වර්තමානයෙහි ක්‍රමයෙන් වර්ධනය වෙමින් පැවැතීම යහපත් ලක්‍ෂණයකි. විශේෂයෙන් යුරෝපයේ හා ඇමරිකාවෙහි ශීඝ්‍රයෙන් බුදුදහම ප්‍රචලිත වීම වර්තමානයෙහි නව ප්‍රවණතාවකි.

ලෝවැඩ සඟරාවෙහි ඉහත කරුණ මෙසේ දක්වා තිබේ.

බලකොටුවන් තර මෙසසර නුවරේ
මුලැසටුවන් දලුලන පව් පඳුරේ
විසකටු වන් සගමොක් මඟ අතුරේ
මිසදිටු වන් අයටත් පින් නොපිරේ

## 7. මිනිස් ලොව මූඪ ව කෙළ තොලු ව දුෂ්ප්‍රාඥ ව ඉපදීම :-

බුදුවරයකුගේ දහමක් පවතින සමයක මිනිසත් භවය ලද සද්ධර්මශ්‍රවණය ලැබෙන පෙදෙසක සැදැහැති පවුල්වල උපන් ඇතැමෙක් මූඪ ව කෙල තොලු ව දුෂ්ප්‍රාඥ ව උපදිති. සද්ධර්මයෙන් ප්‍රතිඵල ලැබීමට නම් ඊට සරිලන නුවණක් තිබිය යුතු ය. උපතින් ම මන්දබුද්ධික වූවෙකුට සද්ධර්මය ප්‍රතිලාභ අවස්ථාව අහිමි වේ.

දද මිනිසුන් බස් ගෙන කිසි කලෙක ය
තද අකුසල් කොට කුසලින් වැළක ය
අඳ ගොළු බිහිරිව ලදුවත් මේ කය
මඳ පිනකුත් නොපිරෙයි බල නිසැක ය

## 8. මිනිස් ලොව බුද්ධිමත් ව මනා උපතක් ලද කල්හි බුදුවරයකු පහළ ව නොසිටීම :-

ඇතැමෙක් ඉහත අභව්‍ය කරුණු සියල්ල ජයගෙන මිනිස් ලොව ප්‍රඥාවන්ත ව උපත ලැබුව ද එකල අබුද්ධෝත්පාද සමයෙකි. බුදුවරයකුගේ දර්ශනයක් හෝ උන්වහන්සේගේ ධර්මයක් හෝ දකින්නට අසන්නට නොලැබේ. මෙය ද අභව්‍ය තත්ත්වයක් වශයෙන් සැලකේ. එවැනි සමයක කෙතරම් බුද්ධිමතුන් ලොව විසුව ද චතුරාර්ය සත්‍ය ධර්ම සංඛ්‍යාත දර්ශනයක් නොමැති බැවින් අවිද්‍යාන්ධකාරයෙන් පිරී පවතී. සැබෑ කුසලාකුසල පිළිවෙතක් හෝ නිවන් මගක් පිළිබඳ ව හෝ එවැනි සමයෙකි පැහැදිලි අවබෝධයක් නොපවතී.

බුදු කෙනෙකුන් මේ ලොව නූපන් වර
අඳුරෙක් ම ය සදහම් නැති මෙසසර
ඉඳුරා නොදනෙයි පව් පින් තොරතුර
සිදු නොකළැකි ඉන් සගමොක් සිරිසර

මෙලොව පවතින දැඩි ම අන්ධකාරය ලෙස සැලකෙන්නේ අන්තරීක්ෂ නිරයෙහි පවත්නා අන්ධකාරයයි. හිරු සඳු දහසකින් නමුදු එහි පවත්නා අඳුර දුරු නොවේ. එම අන්ධකාරයට ද වඩා බලවත් ම අන්ධකාරය නම් අවිද්‍යාවෙන් වැසී පවතින ලෝකයට සද්ධර්මය නමැති ආලෝකය නොලැබීමෙන් හටගන්නා අන්ධකාරයයි.

නිවන් මග හෙළි කරන බුදුරදුන් නමැති සූර්යයා නොනැගි කල්හි මෝහාන්ධකාරයෙන් පටිලී සිටින්නා කෙසේ නම් පින් කරන්න ද? යනුවෙන් සද්ධම්මොපායනයෙහි දක්වේ.

***'බුද්ධාදිච්චෙ අනුදිතෙ - සිද්ධි මග්ගාව භාසකෙ,***
***මොහන්ධකාරෙ වත්තන්තො - කථං පුඤ්ඤං කරිස්සති'.***

මෙලෙස සද්ධර්මයෙන් ප්‍රතිඵල නොලද හැකි අවස්ථා එනම් අක්ඛණ අට පිළිබඳ ව මෙම සූත්‍රයෙහි කරුණු විස්තර කර තිබේ.

| | |
|---|---|
| සැබැවින් බණ ඇසුවත් මුනිඳුන් | කී |
| ගොළුවන් බිහිරන් සේ නොව | සැලකී |
| ඉදිනෙන් මිස තොප කුසලින් | වැළකී |
| මෙලෙසින් පින් නොකළැකි කල් | අටකී |

අක්ඛණ හෙවත් අයෝග්‍ය අවස්ථා යනුවෙන් ඉහත දැක්වූ කරුණු ඉක්මවා සිටීම හැඳින්වෙන්නේ ඛණ හෙවත් ක්ෂණ සම්පත්තිය වශයෙනි. මෙකල ජීවත් වන නුවණැති සැවො ම ක්ෂණ සම්පත්තිය ලද භාග්‍යවන්තයෝ වෙති. විශ්වයෙහි ජීවත් වන සත්ත්වයන් අතර මිනිසුන් වශයෙන් උපත ලබන්නේ ඉතා සීමිත සත්ත්ව සංඛ්‍යාවකි. ලොව වෙසෙන මිනිසුන් මෙන් ප්‍රකෝටි සංඛ්‍යාත ගණනින් අන් සත්ත්වයෝ සිටිති. අන් භවයන් හා සසඳන කල මිනිස් උපතක් හිමිවන්නේ ඉතා සීමිත පිරිසකට ය. මිනිසුන් අතර ද සද්ධර්මය ඇසීමට අවකාශ ඇති සුදුසු පෙදෙසක වෙසෙන සැදැහැවත් පවුල්වල ඉපිද සිටින නුවණැති මිනිසුන් සංඛ්‍යාව ඉතා ම සීමිත ය. එවැන්නෝ අතිශය භාග්‍යවන්තයෝ ය. එම භාග්‍යය ලද තැනැත්තාට අන් කුමන ආකාරයේ අඩුපාඩු, දුෂ්කරතා, ලෙඩදුක් පැවතිය ද ඒ සියල්ලට වඩා තමන් ලද සම්පතෙහි වටිනාකම වැඩි බව නිතර මෙනෙහි කළ යුතු ව ඇත.

*'දුල්ලභා ඛණසම්පත්ති'* යනුවෙන් දැක්වෙන පරිදි දුර්ලභ ක්ෂණ සම්පත්තිය ලද තැනැත්තාගේ ජීවිතයේ ප්‍රධාන කාර්ය විය යුත්තේ ධර්මය වෙනුවෙන් සිය දිවිය කැප කිරීමයි. අන් සියලු කාර්යයන් තබා ගත යුත්තේ ඉන් පහළයි. ගතවන වසරක්, මාසයක්, සතියක්, දිනයක්, මොහොතක් පාසා ම අපි සැවො ම මරණය කරා වේගයෙන් පිය නගන්නෙමු. බොහෝ දෙනෙක් මේ තත්ත්වය නිසා බියෙන් ද පසුවෙති. අප බිය විය යුත්තේත්, දුක් විය යුත්තේත් මරණය නිසා නොවේ. ගතවන මොහොතක් පාසා අපට අහිමි වන්නේ හුදෙක් මිනිස් දිවිය පමණක් නොවේ. අතිශය දුෂ්කර ව ධර්මප්‍රතිලාභය සඳහා පවත්නා අවකාශය සහිත බුද්ධෝත්පාදයයි අපට මේ අහිමි වෙමින් පවතින්නේ. අතිශය දුර්ලභ ව ලද මේ අවස්ථාව අහිමි වීම මුළු ලොවක් අහිමිවීමට ද වඩා බරපතල පාඩුවකි. සද්ධර්මයෙන් ලද හැකි උත්තරීතර ඵලය නොලබා මේ වටිනා අවස්ථාව අහිමි කොට මිනිස් ජීවිතයෙන් සමුගැනීම තරම් අභාග්‍යසම්පන්න දෙයක් මේ තුන් ලොව ම නැත.

එබැවින් ගත වන හැම මොහොත් ම කය වචනය සංවර කර ගනිමින් සීල, සමාධි, ප්‍රඥා සංඛ්‍යාත ආර්ය අෂ්ටාංගික මාර්ගය ඔස්සේ තම ජීවිතය පවත්වා ගන්නට අප්‍රමාදී ව ක්‍රියා කළ යුතු ය. හිස ගිනි ගත්තෙක් ඒ ගින්න නිවීමට උත්සාහ ගන්නේ යම් සේ ද හුලක් ඇනුණු තැනැත්තකු ඒ හුල ඉවත් කර ගැනීමට උත්සාහවත් වන්නේ යම් සේ ද ඊට ද වඩා උද්‍යෝගයෙන් ධර්මයෙහි හැසිරීම සඳහා අනලස් ව වහ වහා අප්‍රමාදී ව කටයුතු කිරීම අවශ්‍ය වේ. ඒ සඳහා තෙරුවන් බෙලෙන ඔබ සැමට ශක්තිය ධෛර්යය සැලසේවා.

# ඔබ සැමට තෙරුවන් සරණයි !

# *Akkhana Sutta*

## The discorse of Inappropriate (Unfortunate) Moments

The Buddha realized and discovered the world reality by him self as it is, and proclaimed it. With the clear comprehension the Buddha pointed out the world reality and the way how to overcome suffering to the world kindly. As human beings we have received a lot of rare opportunities to practice Dhamma, increase our wisdom and get rid of suffering in the present. According to Buddhism, having all things that we gained now is a very rare chance. As an intelligent person who understands this rarerity, should develop his mind to the mamimum level. The Buddha describes the rare things that we have received in this moment.

*Kiccho -manus-sa-paṭi-lābho,*
*kicchaṃ maccāna jīvitaṃ;*
*Kicchaṃ saddham-mas-savanaṃ,*
*kiccho -buddhā-na-mup-pādo.*

Rare is birth as a human being. Hard is the life of mortals. Hard is it to gain the opportunity of hearing the Sublime Truth. Rare is the appearance of the Buddhas.

In this discourse (Akkhana Sutta), the Buddha explains eight inopportune (inappropriate) moments where we can't practice dhamma, increase wisdom and achieve enlightenment.

They are;

1. Some times a Buddha has arisen in the world, an arahant, perfectly enlightened, accomplished in true knowledge and conduct, fortunate, knower of the world, unsurpassed trainer of persons to be tamed, teacher of devas and humans, an Enlightened One, a Blessed One, and the Dhamma leading to peace, nibbāna, and enlightenment is taught as proclaimed by a Fortunate One. But a person has been reborn in hell (*Niraya*). This is the first inopportune moment that is not the right occasion for living the spiritual life.

2. Sometimes, a Buddha has arisen in the world and he points out the path how to overcome suffering, but a person has been reborn in the animal *(Tiracchana)* realm. This is the second inappropriate moment that is not the right occasion for living the spiritual life.

3. Fruther, a Buddha is in the world preaching Dhamma explaining the path of liberation, but a person has been reborn in the sphere of afflicted spirits *(Petaloka)*.

4. Ones a Buddha is appearing in the world and people listen Dhamma and attain enlightenment, but a person has been reborn in a certain order of long-lived devas (*Deegayuska deva*).

5. Some times a Buddha has arisen in the world, people are practicing Dhamma, but a person has been reborn in the outlying provinces (*pacchantadesa*) among the

uncouth foreigners, a place to which bhikkhus, bhikkhunīs, male lay followers, and female lay followers do not travel.

6. Again a Buddha has appeared in the world, he explains Dhamma to devas and men, but a person has been reborn in the central provinces, but he holds wrong view (*Micchadittiko*) and has a distorted perspective: ‘There is nothing given, nothing sacrificed, nothing offered; there is no fruit or result of good and bad actions; there is no this world, no other world; there is no mother, no father; there are no beings spontaneously reborn; there are in the world no ascetics and brahmins of right conduct and right practice who, having realized this world and the other world for themselves by direct knowledge, make them known to others.

7. Further, a person has been reborn in the central provinces, when a Buddha appears in the world, but he is unwise, stupid, obtuse, and unable (*Mudha*) to understand the meaning of what has been well stated and badly stated. This is also an inopportune moment when someone can't practice the dhamma and spiritual path.

8. Sometimes, a person has been reborn in the central provinces, and he is wise, intelligent, astute, and able to understand the meaning of what has been well stated and badly stated. How ever, a Buddha has not arisen in the world. Hence, the Dhamma and sangha are not in the world. In this situation, even he is wise, he has no chance to listen to the Dhamma or practice it or gain enlightenment.

He, who has overcome these inopportune moments like this time, should listen to Dhamma and dedicate his entire life for the liberation as much as he can.

# The Buddha and His Teachings
## බුදුසිරිත සහ බුදුදහම

The Buddha, who was a great spiritual teacher in the world, was born as a human being in India, present Nepal in B.C. 623. His personal name was Siddhattha and his family name was Gotama.The king Suddhodhana and queen Mahamaya were his parents. According to Buddhist canon, he had practiced his spirituality a lot in his previous lives as a Bodhisatta. As the results of his spiritual development, he was born with a great wisdom and merit. He received a good education as a prince as well as a child. Following the Indian custom, he was married quite young, at the age of sixteen, to a beautiful and devoted young princess Yasodhara. Living in luxury palaces, young couple spent a very happy life. Meanwhile prince Siddhattha wanted to realize the life and find a solution for suffering of mankind. At the age of 29, when his only son, Rahula was born, doing his great renunciation, he left his kingdom and became an ascetic searching for a solution to end suffering.

The young ascetic Gotama wandered for six years around the valley of the Ganges, meeting famous religious teachers, studying and following their traditional systems and methods, and submitting himself to rigorous ascetic practices. Siddhattha was not satisfied with those teachings and he gave up all traditional religions and methods. Finally he decided to practice his own way. One evening, he was seated under the Bodhi tree on the bank of the Neranjara River. Practicing the Noble Eight Fold Path, analyzing suffering and cause of suffering, he attained enlightenment at the age of 35. After his enlightenment, he was known as the Gotama Buddha, the supreme one, the enlightened one.

After his great discovery about the world, and how to get rid of suffering, the Lord Buddha explained his discovery to the world compassionately about 45 years. At the age of 80, he passed away. His noble disciples protected his teachings and they brought it from generation to generation.

The Buddha said very clearly, his teaching is not a creation, it is a discovery. Whether a Buddha appears or not in the world, his teaching is forever. We respect him because he discovered this world reality by himself without any help of others and explained it to the world. He himself explained his teachings' summary in a stanza. It is,

*'Sabba pāpassa akaranam kusalassa upasampadā,*
*Sacitta pariyodapanam etam buddānasānam'*. (Dhammapada)

Not to do any evil, do good and purify one's mind is the message of all Buddhas.

All Buddhas who arise in the world during certain periods of time discover this very same message and kindly preach it to the world. In summary, the Buddha pointed out to the world the path of happiness that is getting rid of suffering. Here, we can see three steps. According to this message the Buddha's effort was avoiding going to hell, encouraging going to heaven (සග්ගමග්ග) and showing the path to liberation (මොක්ඛමග්ග).

When we do evil, our mind is polluted. That polluted mind causes suffering in this life and hereafter. That is why the Buddha said not to do any evil. Not doing evil is not enough for happiness, but also we have to cultivate good for the real happiness with meritorious mind. Buddhism emphasizes the three merits for the happiness. The three

meritorious deeds of generosity (*dāna*), virtue (*seela*) and meditation (*bhāvanā*) cause us to succeed in this life and thereafter. If a person has done a lot of meritorious deeds in this life, it means that his mind is rich in merits. A Meritorious mind can gain happiness. When we do good deeds, it means our mind is pure, calm and quiet. A pure mind can bring happiness to our life.

Further, we have to understand the cause of suffering and getting rid of suffering in this life itself. That is why the Buddha explained how to purify one's mind. Virtue, concentration or tranquility and wisdom with understanding of dependent origination cause us to get rid of all sufferings and develop real happiness. Virtue means a very high level of discipline in behavior and speech with right vision. With a good discipline, if a person focuses his mind in a particular meritorious object such as loving kindness and breathing meditation, he can concentrate his mind with pure thoughts. With that concentration, if one has to reflect on the world reality according to impermanence (*anicca*), suffering (*dukkha*) and selflessness (*anatta*) in the correct way. As a result, one can live without desire and hatred because there is no delusion. When he investigates that present moment he has only present moment as nothing comes to the present from the past and nothing goes to the future from the present. The most valuable and interesting explanation in Buddhism is impermanence. It is said in Buddhism; **not being occurred (in the past) comes to an occurrence. Being occurred (at the present) will not come to (the future) occurrence (අහුත්වා සම්භූතං හුත්වා න භවිස්සති).** This is the nature of impermanence that Buddhism illustrates. He sees the arising and ceasing of all his experiences at the moment very well. Then he can live as a person seeing the truth of world reality in a new fresh way. This is the ultimate truth that Buddhism teaches us to be able to get rid of all sufferings.

පැසදිනාහි ලොස් ඇන්ජලිස් බෞද්ධ විහාරස්ථානයේ

ස්වාමීන් වහන්සේලා මෙහෙයවන

# ධර්ම චාරිකා වැඩසටහන

බු.ව. 2560 නවම් මස (ව්‍ය.ව. 2017.02.04) ශනි දින

(**දායකත්වය:** දුලිප්, දිල්හාරා කලුආරච්චි මහත්මා - මහත්මිය ඇතුළු දරුවන්)